"වෛරසය ආසාදිත පුද්ගලයින් රෝගීන් මිස අනෙක් අයට රෝගය පතුරවන පුද්ගලයින් ලෙස හැඳින්වීමෙන් වළකින්න" යනුවෙන් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් කොවිඩ්-19 වාර්තාකරණය සඳහා මාධ්‍ය වෙත නිකුත් කොට ඇති නිර්දේශයන්හි දැක්වේ. මෙම නිර්දේශ මාලාවේ අරමුණ වන්නේ, කොවිඩ්-19 ආසාදිතයන් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ සහ අගතිකාරී ආකල්පයක් ඇතිවීමට ඇති හැකියාව අවම කිරීමත්, ඒ ඔස්සේ රෝගීන් නිසි වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර නොගෙන සැඟවීමට ඇති ඉඩ අවම කිරීමත් වෙයි.

කරුණු එසේ වුවත්, මාධ්‍ය මගින් දිගින් දිගටම මෙම කොවිඩ්-19 වාර්තාකරණය සම්බන්ධ ආචාර ධාර්මික නිර්දේශයන් කඩ කිරීම කණගාටුවට කරුණකි. මව්බිම (10/21) පුවත්පතේ "කොරෝනා ආසාදිත වූ කඩුවෙල අවන්හල් සේවකයා හතර වටේ ගිහින්" යන සිරස්තලයෙන් යුතුව පළ කොට ඇති වාර්තාව ඊට නිදසුනකි. මෙම පුවත් වාර්තාව තුළ, "...අවන්හල් සේවකයා කඩුවෙල නගරය ඇතුළු ස්ථාන කිහිපයකම ගැවසීම හේතුවෙන්..." යනුවෙන්ද දැක්වෙයි. මෙම පුවත් වාර්තාව ඔස්සේ හැඟවීමට උත්සාහ ගන්නේ අදාළ ආසාදිතයා වරදක් කොට ඇති බවක් නොවේද?

කොවිඩ්-19 ආසාදනය වීම පුද්ගලයෙකුගේ වරදක් නොවේ. එසේ නම්, ඉහත පුවත් වාර්තාව කොවිඩ්-19 වාර්තාකරණය සම්බන්ධ ආචාර ධර්මයන් උල්ලංඝනය කරන්නක් නොවේද?

කොවිඩ්-19 වසංගතය මර්දනය සඳහා මාධ්‍ය විසින් ලබාදිය යුතු දායකත්වය වන්නේ, ආචාර ධාර්මික මාධ්‍යකරණයක යෙදීම බව අපි අවසානයට සිහිපත් කරමු.

මූලාශ්‍ර: https://mcusercontent.com/.../6a771830-d3bd-456e-8fbf...

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #Mawbima #NewsPapers #Coronavirus**